පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# පළමු වාර පරීක්ෂණය - 2023

| ශ්‍රේණිය |
| --- |
| 11 |

විෂයය :- ..........................................................................

| 63 | S | I,II |
| --- | --- | --- |

පාසලේ නම : ..................................................................................................

ඇතුළත්වීමේ අංකය : .............................

කාලය : පැය 03 යි

## ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II

### ව්‍යවසායකත්ව අධ්‍යයනය I

සැලකිය යුතුයි.;

- **සියලුම** ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්ණවලට දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** පිළිතුර තෝරන්න.

01.ව්‍යවසායකයාට නිරන්තරයෙන් ඇති ශක්තිය වනුයේ,

(1). ඉහළ මූල්‍ය ශක්තියකින් යුතු වීම. (2) අන් අය පිළිබද විශ්වාසය

(3). වාසනාව පිළිබද විශ්වාසය (4) තමා පිළිබද විශ්වාසය

02.පරිසරයේ වෙනස්වීම් වලට උචිත පරිදි අනුගත වීමට ව්‍යවසායකයකු සතු හැකියාව හදුන්වන්නේ,

(1) නම්‍යශීලීත්වය ලෙසයි. (2) ව්‍යවසායකත්වය ලෙසයි.

(3) අවදානම් දැරීම ලෙසයි. (4) නිර්මාණශීලීත්වය ලෙසයි.

03.භෞතික පැවැත්මක් තිබීම, ගබඩා කල හැකි වීම, සපයන්නාගෙන් වෙන් කල හැකිවීම,

(1) අවශ්‍යතාවල ලක්ෂණය. (2) සේවාවල ලක්ෂණය.

(3) භාණ්ඩවලලක්ෂණය. (4)වුවමනාවල ලක්ෂණය.

04.අවදානම හා ප්‍රතිලාභ අතර ඇත්තේ,

(1) අනුලෝම සම්බන්ධතාවයකි. (2) ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.

(3) ඍණ සම්බන්ධතාවයකි. (4) වක්‍ර සම්බන්ධතාවයකි.

05.පහත දෑ අතුරින් වුවමනාවකට නිදසුනක් වන්නේ,

(1) ආහාර පාන (2) ආරක්ෂාව

(3) පාසල් (4) විනෝදාංශ

06. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයකි.

(1) සංකලනයක් (2) අනපේක්ෂිත සිදුවීමක්.

(3) අනුකරණය කිරීමක් (4) දිගුවක්

07.ප්‍රදේශයේ ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම හා ඩෙංගු රෝග මර්ධනය පිළිබඳව දැනුම්වත් කිරීමේ . වැඩසටහනක් **බිනර** විසින් ක්‍රියාත්මක කළේය. ඒ අනුව **බිනර,**

(1) අභ්‍යන්තර ව්‍යවසායකයෙකි. (2) ව්‍යාපාර ව්‍යවසායකයෙකි.

(3) ආයතනික ව්‍යවසායකයෙකි. (4) සමාජයීය ව්‍යවසායකයෙකි.

08.ව්‍යවසායකයකු තම අභිමතය පරිදි තීරණ ගැනීම හා කටයුතු කිරීම සිදුකරයි. මෙය හැඳින්විය හැක්කේ,

(1) අවදානම් දැරීම ලෙසය. (2)ස්වයං පෙළඹවීම ලෙසය.

(3) ස්වාධීනත්වය ලෙසය. (4) දැක්ම ලෙසය.

09. ව්‍යාපාරයකට පාලනය කළ හැකි පාරිසරික සාධක ඇතුලත් වන්නේ,

(1) ආසන්න පරිසරයටය. (2) බාහිර පරිසරයටය.

(3) ආර්ථික පරිසරයටය. (4) අභ්‍යන්තර පරිසරයටය.

10. අවදානම් සහිත ව්‍යාපාර අවස්ථා හඳුනාගනිමින් නිර්මාණශීලීව නවෝත්පාදන සිදුකරන්නා,

(1) ආයෝජකයා වේ. (2) ව්‍යවසායකයා වේ.

(3) නිෂ්පාදකයා වේ. (4) ව්‍යාපාරිකයා වේ.

11. ව්‍යවසායකයකුගේ භූමිකා දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) අයිතිකරු,කළමණාකරු, නායකයා (2) කළමණාකරු, නායකයා, සැපයුම්කරු

(3) අයිතිකරු , නිෂ්පාදකයා, කළමණාකරු (4) අයිතිකරු , සේවකයා, කළමණාකරු

12.ව්‍යවසායකයකු තම ව්‍යාපාරය කෙරෙහි ඇති ශක්තීන් හඳුනාගැනීම සඳහා අධ්‍යනය කළ යුත්තේ,

(1) ආසන්න පරිසරයයි. (2) බාහිර පරිසරයයි.

(3) දේශපාලන පරිසරයයි. (4) අභ්‍යන්තර පරිසරයයි.

13. රජය විසින් ව්‍යවසායකයින් සඳහා සහන පොලියට ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හැඳින්විය හැක්කේ,

(1) ශක්තියක් ලෙසය. (2) තර්ජනයක් ලෙසය.

3) අවස්ථාවක් ලෙසය. (4) අභියෝගයක් ලෙසය.

14.ව්‍යවසායකයින්ගේ මූලිකම ගති ලක්ෂණයක් නොවන්නේ,

(1) පරිසර සංවේදි බව (2) සුභවාදී වීම

(3) කැපවීම (4)නම්‍යශීලීත්වය

15. ව්‍යාපාරය සතු භෞතික හා මානව සම්පත් මෙහෙයවමින් ව්‍යාපාරයේ අරමුණු ඉටු කරගැනීමට නායකත්වය ලබාදෙන්නේ,

(1) කළමණාකරුවන්. (2) අයිතිකරුවන්.

(3) ප්‍රවර්ථකයින්. (4) සේවකයින්.

16.ව්‍යවසායකත්වය තුලින් ව්‍යවසායකයාට හිමිවන සමාජයීය ප්‍රතිලාභයක් නොවන්නේ,

(1)සමාජයීය පිළිගැනීම. (2) ස්වයංපෝෂිත බව.

(3) නායකත්වය හිමිවීම. (4) කීර්ති ප්‍රශංසා හිමිවීම.

17විදේශ වෙළඳාම, අන්තර්ජාතික ගිවිසුම් වැනි සාධක අයත් වන්නේ,

(1) ආර්ථික පරිසරයටය. (2) ආසන්න පරිසරයටය.

(3) දේශපාලන හා නෛතික පරිසරයටය. (4) ගෝලීය පරිසරයටය.

18.රැකියාවක නිරතවන පුද්ගලයකුට වඩා ව්‍යවසායකයකුට හිමිවන ප්‍රතිලාභයක් වන්නේ,

(1) ඉහළ මූල්‍ය ප්‍රතිලාභ ලැබීමට හැකි වීම.

(2) සමාජ පිළිගැනීමක් ලබාගත හැකි වීම.

(3) නිශ්චිත පරිසර තත්ත්වයක් යටතේ කටයුතු හැකි වීම.

(4) ප්‍රයෝජනයට නොගත් හැකියා භාවිතයට ගත හැකි වීම.

19.ව්‍යාපාර සම්බන්ධයෙන් සත්‍යයක් නොවන්නේ,

(1) අවදානමක් පැවතීම. (2) සෑම ව්‍යාපාරයකම ලාභ අරමුණක් පමණක් තිබීම.

(3) මිළ මත ගණුදෙනු සිදුවීම. (4) ආර්ථික කටයුත්තක් වීම.

20.ව්‍යවසායකයින්ට මුහුණ පෑමට සිදුවන අවදානමට ප්‍රධාන හේතුව වන්නේ,

(1) වගකීම් සහිත බවයි. (2) වාසනාවයි.

(3) දුර්වලතා පැවතීමයි. (4) අවිනිශ්චිතතාවයි.

21. කුඩා පරිමාණ ව්‍යාපාර සම්බන්ධයෙන් ඇති සීමාවක් වන්නේ,

(1) ගතික පරිසරයට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට හැකිවීම. (2) පහසුවෙන් ආරම්භ කළ හැකිවීම.

(3) පවුලේ සාමාජිකයින්ගේ මැදිහත්වීම. (4) දේශීය තාක්ෂණය භාවිතයට ගැනීම

22. කොවිඩ් -19 වසංගතය ව්‍යාපාර කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන ලදි. මෙම සාධකය අයත් වන්නේ,

(1) ස්වාභාවික පරිසරයටයි. (2) ප්‍රජා පරිසරයටයි.

(3) සමාජ හා සංස්කෘතික පරිසරයටයි. (4) සමාජයීය පරිසරයටයි.

23. ව්‍යවසායකයකු සතු තාක්ෂණික කුසලතාවක් වන්නේ,

(1) නව වෙළඳපොළ සොයා ගැනීමය.

(2) විධිමත් පටිපාටියකට අනුව හොඳ සේවකයකු බඳවා ගැනීමය.

(3) අදාළ පාර්ශව අතර තොරතුරු බෙදාහැරීමය.

(4) නියමිත වේලාවට කාර්යයන්හි නිරත වීමය.

24. නූතන ව්‍යාපාර පරිසරයේ ලක්ෂණයක් වන්නේ,

(1) වෙනස්වීමේ වේගය ඉතා අඩුය. (2) ව්‍යාපාරිකයෝ බලවත් වී ඇත.

(3) පාරිභෝගිකයෝ බලවත් වී ඇත. (4) ලාභය ප්‍රධාන අරමුණ වීම.

25. ව්‍යවසායකයින් නිසා දේශීය ආර්ථිකය සංවර්ධනය වන බවට හේතු සාධකයකි,

(1) ව්‍යවසායකයා ස්වයංපෝෂිත වීම. (2) ඉහළ ව්‍යාපාරික ලාභ ලැබීම.

(3) රැකීරක්ෂා ජනනය වීම. (4) සුපිරි වෙළඳසැල් බිහිවීම.

26.“Teen”සපත්තු නිෂ්පාදන ව්‍යපාරය අයත් වන්නේ ශ්‍රී ලංකා ආර්ථිකයේ කුමන ව්‍යපාර අංශයටද?

(1) ප්‍රාථමික අංශයටය. (2) ද්විතියික අංශයටය.

(3) තෘතීයික අංශයටය. (4) ඉදිකිරීම් අංශයටය

27.ව්‍යපාර සඳහා බලපෑම් ඇති කරන අභ්‍යන්තර පරිසර සාධකයක් නොවන්නේ,

(1) සම්පත් (2) සේවකයින්

(3) කළමණාකරුවන් (4) ගණුදෙනුකරුවන්

28. නව ව්‍යපාරයක් සඳහා යෝග්‍ය පිවිසුම් උපාය මාර්ගයක් නොවන්නේ,

(1) අනුකරණය (2) වෙළෙඳපොළ හිඩැස

(3) නවොත්පාදනය (4) නිෂ්පාදිත ප්‍රභේදනය

29. ලිපිද්‍රව්‍ය අලෙවිසැලක ඉලක්කගත පාරිභෝගිකයින් නොවන්නේ,

(1) පාසල් සිසුන්. (2) කම්කරුවන්

(3) නීතීඥවරුන්. (4) ලේඛකයින්

30 නව ව්‍යවසායකයකුට වෙළඳපොළට ප්‍රවේශ විය හැකි විකල්ප ක්‍රම අතුරින් ව්‍යවසායකයාට ඉහළම අවදානමක් පවතින්නේ,

(1) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කිරීම තුලිනි.

(2) පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළට ඉදිරිපත් කිරීම තුලිනි.

(3) නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපොළට ඉදිරිපත් කිරීම තුලිනි.

(4) නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළට ඉදිරිපත් කිරීම තුලිනි.

31. SCAMPER ආකෘතියට අනුව සම්බන්ධ කිරීමට උදාහරණයක් වන්නේ,

(1) මේද රහිත කිරිපිටි (2)අන්තර්ජාල පහසුකම්සහිත දුරකථන

(3) කුඩා පරිගණක (4) මෙගා බීම බෝතල්

32. සෑම ව්‍යාපාර අදහසක්ම අවස්ථාවක් නොවේ. ඒ අනුව ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණයක් වන්නේ

(1) අනාවරණය කර ගැනීම අසීරු වීම. (2) සුලභ වීම.

(3) විවෘත වීම. (4) අනාවරණය කර ගැනීම පහසු වීම.

33. යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේ පියවරයන් පිළිවලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සූක්ෂම විශ්ලේෂණය, සාර්ව විශ්ලේෂණය, ශදුඅතවිශ්ලේෂණය,

(2) සාර්ව විශ්ලේෂණය,ශදුඅත විශ්ලේෂණය, සූක්ෂම විශ්ලේෂණය

(3) සාර්ව විශ්ලේෂණය , සූක්ෂම විශ්ලේෂණය,ශදුඅත විශ්ලේෂණය,

(4) ශදුඅත විශ්ලේෂණය, සාර්ව විශ්ලේෂණය , සූක්ෂම විශ්ලේෂණය

34. පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය වන්නේ,

(1) අවුː 10 කි (2) අවුː 15 කි (3)අවුː 20 කි (4) අවුː 25 කි

35.අලෙවි මිශ්‍රයට (4Ps) අයත් නොවන සාධකය තෝරන්න

(1) මිළ (2) ගුණත්වය (3) නිෂ්පාදිතය (4) ප්‍රවර්ධනය

36. නිෂ්පාදන සැලැස්ම පිළියල කිරීමේ මූලික අරමුණ වන්නේ, අපේක්ෂිත

(1) මුළු භාණ්ඩ පිරිවැය ගණනය කිරීමය. (2)මුළු ඉල්ලුම් ප්‍රමාණය ගණනය කිරීමය.

(3) මුළු අලෙවි පිරිවැය ගණනය කිරීමය. (4)මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමය.

37. විස්තරාත්මක ව්‍යාපාර සැලැස්මක් මගින් නිරූපනය කරනු ලබන්නේ,

(1) නිෂ්පාදන තොරතුරු හා ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය.

(2) ආයෝජන තීරණ පිළිබඳවය.

(3) අයිතිකරු ප්‍රාග්ධනය සපයාගත් අකාරය පිළිබඳවය.

(4) ව්‍යාපාරයේ සමස්ථ කටයුතු මෙහෙයවනුලබන ආකාරය පිළිබඳවය.

38. ව්‍යාපාරයට අවශ්‍යවන සේවකයින් වර්ග පිළිබඳව දක්වනු ලබන්නේ,

(1) පරිපාලන සැලැස්ම තුළය. (2) මූල්‍ය සැලැස්ම තුළය.

(3) අලෙවි සැලැස්ම තුළය. (4) නිෂ්පාදන සැලැස්ම තුළය.

39.අලෙවි සැලැස්ම තුළ අන්තර්ගත විය යුතු අංගයකි.

(1) වෙළඳපොළ විශ්ලේෂණය (2) නිෂ්පාදන පිරිවැය

(3) ඒකක පිරිවැය (4) සේවක වැටුප් හා වේතන

40. ව්‍යවසායකයින්ට නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය පසුබිම සකසනු ලබන්නේ,

(1) අනලස් සේවකයින්ය. (2) නිර්මාණශීලී කළමණාකරුවන්ය.

(3) රාජ්‍ය අංශයෙන් ලබාදෙන දිරිගැන්වීම්ය. (4) ව්‍යාපාර පරිසර සාධකය.

# ව්‍යවසායකත්ව අධ්‍යයනය II

❖ **පළමු** ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්ණ **පහකට** පිළිතුරු සපයන්න

01 පහත සදහන් සිද්ධිය හොදින් කියවා (i) සිට (x) තෙක් ඇති ප්‍රශ්ණාවලට පිළිතුරු සපයන්න

මනීෂ කුඩාකල සිටම අධ්‍යාපනයට දක්ෂතා නොදැක්වූ දරුවකු වුවද ඔහු ක්‍රීඩාවට දක්ෂ , ක්‍රියාශීලි, නිර්මාණශීලි උත්සහවන්ත අයෙකි. ඔහුට වැඩිමහල් සහෝදරියක්ද සිටින අතර ඔහුගේ පියා සුළු පරිමාණයෙන් සහල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මනීෂ කුඩා කල පටන්ම ඔහුගේ පියාගේ ව්‍යාපාරයට සහය විය. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමෙන් අනතුරුව පාසල් ගමන නිම කල ඔහුගේ අභිප්‍රාය වූයේ තම පියාගේ ව්‍යාපාරය දියුණු කර එම ව්‍යාපාරයේ සහල් රට පුරා අලෙවිකර දේශීය වශයෙන් කීර්තිමත් ව්‍යාපාරයක් බවට පත් කිරීමයි.

තම සහෝදරියගේ මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කුඩා පරිමාණ ව්‍යාපාර හා ව්‍යවසායකත්වය පිළිබද සහතික පත්‍ර පාඨමාලාවක් හැදෑරීම තුලින් ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යා යුතු ආකාරය සහ ව්‍යාපාර සැලසුම් කළ යුතු ආකාරය යනාදිය පිළිබද උගත් ඔහු පියාගේ සහයෝගය ද ඇතිව ව්‍යාපාරය පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. එහිදී ඔහු වැඩි අවධානයක් යොමු කලේ ඉහළ ගුණත්වයෙන් යුතු සහල් තම පාරිභෝගිකයින් වෙත ලබා දීම කෙරෙහිය. එමෙන්ම ප්‍රදේශයේ රැකියා නොමැති තරුණයින් තිදෙනෙකු සේවයට බදවාගත් ඔහු සහල් පිරිසිදු කරන නවීන යන්ත්‍රයක් ද ආකර්ශණීය පරිසර හිතකාමී ඇසුරුම් ද තම ව්‍යාපාරය සදහා අලුතින් එකතු කර ගන්නා ලදි.

(i) මනීෂ තුලින් හදුනාගත හැකිව තිබූ ව්‍යවසායකත්ව ගති ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) මෙම ව්‍යාපාරය තුළින් ඉටු කරනු ලබන පුද්ගල අවශ්‍යතාවක් සහ වුවමනාවක් දක්වන්න.

(iii) ව්‍යාපාරය පුළුල් කිරීමට ඔහු සතුව තිබූ ශක්තීන් දෙකක් ලියන්න.

(iv) මෙම ව්‍යාපාරය මගින් දේශීය ආර්ථිකයට හිමි වන ප්‍රතිලාභ දෙකක්දක්වන්න.

(v) ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ ප්‍රයෝජන දෙකක් දක්වන්න.

(vi) ව්‍යාපාර සැලැස්මක මූලික අංග නම් කරන්න.

(vii) මනීෂ පියාගේ ව්‍යාපාරය පුළුල් නොකළේ නම් ඔහුට කළ හැකිව තිබූ වෙනත් ව්‍යාපාර දෙකක් ලියන්න.

(viii) මනීෂ රැකියාවක නිරත නොවී තමාගේම ව්‍යාපාරයක නිරත වීමෙන් ඔහුට ලැබෙන ප්‍රතිලාභ දෙකක් දක්වන්න.

(ix) මනීෂට මෙම ව්‍යාපාරය පුළුල් කිරීම සදහා අවශ්‍ය අරමුදල් සපයා ගත හැකි ආකාර දෙකක් ලියන්න.

(x) මෙම ව්‍යාපාරය සදහා සුදුසු දැක්මක් ලියන්න.

(ලකුණු $2 \times 10 = 20$)

02. (i) ව්‍යවසායකයකු හා ව්‍යාපාරිකයකු අතර දැකිය හැකි සමානතා දෙකක් හා වෙනස්කම් දෙකක් දක්වන්න.

(ii) වර්තමාන සමාජය තුළ දැකිය හැකි ව්‍යවසායකයින් වර්ග දෙකක් දක්වන්න.

(iii) නිර්මාණශීලීත්වය යන්න නිර්වචනය කරන්න.

(iv) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර හතරක් දක්වන්න.

(v) නිෂ්පාදන සාධක නම් කරන්න.

(ලකුණු 2 × 5 = 10)

03. (i) නිර්මාණශීලීත්වය වර්ධනය කරගත හැකි ක්‍රම හතරක් ලියන්න.

(ii) ව්‍යවසායකයකුට සමාජයීය සුභසාධනය උදෙසා කළ හැකි කාර්යය හතරක් ලියන්න.

(iii) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් දෙකක් ලියන්න.

(iv) ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ව්‍යවසායකයකු විසින් ගත යුතු තීරණ හතරක් සඳහන් කරන්න.

(v) කුඩා පරිමාණ ව්‍යාපාර වල ගති ලක්ෂණ හතරක් ලියන්න.

(ලකුණු 2 ×5 = 10)

04 (i) කුඩා පරිමාණ ව්‍යාපාර ආශ්‍රිතව හදුනාගත හැකි සීමාවන් හතරක් ලියන්න.

(ii) කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග හතරක් දක්වන්න.

(iii) ව්‍යවසායකයකුගේ අයිතිකරු භූමිකාවට අයත් කාර්යයන් දෙකක් දක්වන්න.

(iv) ව්‍යාපාර පරිසරය අධ්‍යනය කිරීම තුළින් ව්‍යවසායකයකුට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න.

(v) ප්‍රාථමික අංශයේ ව්‍යාපාර සඳහා උදාහරණ දෙකක් දක්වන්න.

(ලකුණු 2 ×5 = 10)

05 (i) විද්‍යාත්මක හා තාක්ෂණික පරිසරය වෙනස්වීම තුළින් පැන නැගී ඇති ව්‍යාපාරික අවස්ථා දෙකක් දක්වන්න.

(ii) ඉලක්කගත පාරිභෝගිකයා යනු කවරෙක්ද ?

(iii) ව්‍යවසායකයකු විසින් වර්ධනය කරගතයුතු මූලික කුසලතා හතරක් දක්වන්න.

(iv) පරිසර ප්‍රවණතා වලට සංවේදී වීමෙන් ව්‍යවසායකයකුට ලගාකරගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

(v) ව්‍යාපාර අදහස් මතුවිය හැකි මූලාශ්‍ර හතරක් නම් කරන්න.

(ලකුණු 2 ×5 = 10)

06 (i) ව්‍යාපාර සැලැස්මක් යන්න නිර්වචනය කරන්න.

(ii) ව්‍යාපාරයක් පිහිටුවන ස්ථානය තීරණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක හතරක් දක්වන්න.

(iii) හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණ හතරක් දක්වන්න.

(iv) ව්‍යාපාරිකයකුට අලෙවි ප්‍රවර්ධනය සඳහා භාවිත කල හැකි උපක්‍රම හතරක් දක්වන්න.

(v) මෑතකදී බිහි වූ නවෝත්පාදන සඳහා උදාහරණ දෙකක් ලියන්න.

(ලකුණු 2 ×5 = 10)

07. රන්දුණුගේ ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයේ පාසල් ඩෙස්ක් 50 ක් සඳහා පිළියල කරන ලද නිෂ්පාදන වියදම් ඇස්තමේන්තුව පහත පරිදි වේ.

| අයිතමය | වටිනාකම (රුː) |
|---|---|
| දැව සඳහා | 35000.00 |
| යකඩ සඳහා | 80000.00 |
| තීන්ත සඳහා | 6500.00 |
| වඩු කාර්මික වැටුප් | 17500.00 |
| අත් උදවු කරු වැටුප් | 12500.00 |
| ගොඩනැගිලි කුලී | 3000.00 |
| විදුලි වියදම් | 2000.00 |
| යන්ත්‍ර උපකරණ ක්ෂය | 1500.00 |
| අනෙකුත් වියදම් | 4000.00 |

අවශ්‍ය වන්නේ,

(i) ඉහත තොරතුරු ඇසුරෙන් ඩෙස්ක් 50 ක් සඳහා මුළු නිෂ්පාදන පිරිවැය සොයන්න.

(ii) එක් ඩෙස්ක් එකක පිරිවැය සොයන්න.

(මුළු ලකුණු 10)